## ''රණවිරු නෙත් පහන''
## රණවිරුවන්ට මානෙල්මල් එළියක්







# ව්‍යාපෘති වාර්තාව

# අරමුණ

බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය එරෙහිව සටන් වදින වීරෝදාර රණවිරුවන්ගෙන් සැලකිය යුතු පිරිසකගේ දූ දරුවන් රාත්‍රියේ තම අධ්‍යාපන කටයුතු වල නියැලෙන්නේ භූමිතෙල් කුප්පි ලාම්පුවේ මලානික ආලෝකයෙන් බව ඔබ දන්නවා ද?

එය

T අවදානම් සහගතය.

T සෞඛ්‍යයට අහිතකරය.

T භූමිතෙල් මිල ඉහල යෑම මගින් පවුලේ ආර්ථිකයට ඇතිකරන වැය බර වැඩිවේ.

T පැහැදිලි, දීප්තිමත් ආලෝකයක් එමගින් නොලැබේ.

අපේ රණවිරුවන්ගේ දූ දරුවන්ට මේ අන්දමින් රාත්‍රියේ තම අධ්‍යාපන කටයුතු වල නියැලෙන්නට සිදුව තිබීම පිළිබඳව අප ලැජ්ජාවට පත්විය යුතු නැද්ද? ඒ පිළිබඳව අප කණගාටු විය යුතු නොවේද?

මෙම බොහෝ විදුලිය අහිමි නිවාස පවතින්නේ ග්‍රාමීය ප්‍රදේශවලය. එම නිවාස සඳහා විදුලිය ලබා දීම කෙටි කාලයකින් කළ හැකි බවක් අපට නොපෙනේ. එමෙන්ම එය වියදම් අධික කාර්යයක් බැවින් මානෙල් මල් ව්‍යාපාරය වැනි සංවිධානයකට තනිව සිදුකළ හැක්කක්ද නොවේ. එහෙත් එසේ වූ පමණින් වීරෝධාර රණවිරුවන්ගේ දූ දරුවනට කුප්පි ලාම්පු එළියෙන් පොත් පත් හැදෑරීමට ඉඩදී ඉවත බලාගෙන සිටීම හෘද සාක්ෂිය හිමි අපට කළ හැකි ද නොවේ. එසේනම් අප කළ යුත්තේ කුමක්ද? විසඳුම කුමක්ද?

# ස්වියං විදුලි ජනක මේසය

අප රටේම තරුණ ඉංජිනේරුවකු වන උදය හෙට්ටිගොඩ මහතා විසින් නිපදවන ලද ස්වයං විදුලිජනක මේසය අපේ අවධානයට ලක් වන්නේ මේ ප්‍රශ්නයට පිළිතුරක් වශයෙනි.

මෙම ස්වයං විදුලි ජනක මේසය දරුවන් දෙදෙනකුට එකවර ප්‍රයෝජනයට ගත හැකි පරිදි නිර්මාණය කර තිබේ. එහි ඉහල රඳවා ඇති බල්බ මගින් ලැබෙන විදුලිය අලෝකය ඉතා දීප්තිමත් වූවකි. මෙම විදුලිය බල්බ දැල්වෙන්නේ බැටරියක් මගිනි. එම බැටරිය වසර 2 ක වගකීම් කාලයකට (2 year Warranty) හිමිකම් කියයි. එම බැටරිය බල ගැන්වෙන්නේ මේසයේ පහත තිබෙන මහන ''මැෂිමක්'' මෙන් පාදයෙන් සුළු බලයක් යොදවා ප්‍රධාන රෝදය කරකැවීමෙනි. එවිට එලවුම් පටියක් මගින් ඊට සම්බන්ද කොට ඇති විදුලි



ජනකයෙන් විදුලිය නිපදවා බැටරිය බලගැන්වීම සිදුකෙරේ. මෙම ''පැඩලය'' පැය භාගයක කාලයක් එක්වරක් හෝ විටින් විට පැගු විට පැය 500 ක කාලයක් විදුලිය බුබුළු දැල්වේ.එම බැටරියෙන්ම තවත් විදුලිය බුබුළු 02 ක් නිවසේ අවශ්‍ය ස්ථානවල දල්වා ගැනීමේ හැකියාවද තිබේ. මීට අමතරව වෝල්ට් 06 බැටරි යොදා ගනිමින් නිපදවා ඇති ජංගම විදුලි පන්දමක්ද මෙමගින් දැල්විය හැකිය.

බොහෝ විට විදුලිය අහිමි නිවාස කුඩා ප්‍රමාණයේ ඒවා වේ. එනිසා මෙමගින් දරුවන් ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා පමණක් නොව පොදුවේ නිවසේ ආලෝකය ඇතිකර ගැනීම සඳහා ද යොදා ගැනීමේ හැකියාව තිබේ. මෙම සියලු පහසුකම් සහිත එක් මේසයක් සඳහා රුපියල් දසදහසක(10000.00) පමණ මුදලක් වැයවේ. දැනටම ආරම්භයක් ලෙස මානෙල් මල් ව්‍යාපාරයේ අරමුදල් යොදවා මේස 100 ක් නිපදවීම අරඹා තිබේ. එම ප්‍රථම විදුලි ජනක මේස ප්‍රධානය කිරීම 2008 පෙබරවාරි මාසයේදී සිදුකිරීමට නියමිතය. එය එක් අතකින් අප රටේ නව නිර්මාණ කරුවෙකුට නැගී සිටීමට අතදීමකි. තවත් අතකින් කුප්පි ලාම්පුවෙන් රැය පහන් කරන රණවිරුවන්ගේ නිවසට ආලෝකය රැගෙන යාමකි.

## ඔබේ දායකත්වයක් ලබා දෙන්න

මේ සඳහා ඔබටද දායක වියහැකිය. ඔබ කළ යුත්තේ මෙම ස්වයං විදුලි ජනක මේස හැකි ප්‍රමාණයකට මුදලින් දායක වීමය. ඔබ මූල්‍ය අනුග්‍රහය ලබා දෙන සෑම විදුලිය ජනක මේසයකම ඒබව සඳහන් කිරීමට අපි කටයුතු කරමු. එමෙන්ම ඒ සඳහා සාධාරණ ප්‍රචාරයක් ලබාදීමට ද අපි උනන්දුවෙමු.

## දායක වන්නේ කෙසේද?

මේ සදහා ඔබ මූල්‍යමය වශයෙන් දායක වන්නේනම්, එම සියලු මුදල් මානෙල් මල් ව්‍යාපාරය නමින් බොරැල්ල මහජන බැංකුව 078100143688412 දරණ ගිණුමට බැර කළ යුතුය. එසේ නොවේ නම් මුදල් මානෙල් මල් ව්‍යාපාරයේ නියමුවන් වෙත මුණගැසී ප්‍රදානය කළ හැකිය. බැංකු ගිණුමට මුදල් බැර කරන්නේනම් එහි ලදුපතේ පිටපතක් සමග, ලිඛිත දැනුම්දීමක් අප වෙත සිදු කළ යුතුය. මහා පරිමාණයෙන් මෙම සද්කාර්ය සඳහා ඔබ දායක වන්නේ නම් මානෙල් මල් ව්‍යාපාරය සමඟ ගිවිසුමක් අත්සන් කර වුව විධිමත්ව එය සිදුකල හැකිය.

මේ පිළිබඳ වැඩිදුර විස්තර, දුරකතන අංක **011-2667512** මගින් **අනුර අතපත්තු** මහතා අමතා ලබාගත හැකිය.

දැනට රුපියල් කෝටි හතලිහකට වැඩි මුදලක් රණවිරු සුභසාධනය වෙනුවෙන් වැය කර දැවැන්ත සේවාවක් සුදු කර ඇති මානෙල් මල් ව්‍යාපාරය රණ විරුවන් වෙනුවෙන් ඔබගේ සහයෝගය අපේක්ෂා කර සිටී. රුදුරු කොටි ත්‍රස්තවාදයට එරෙහිව සටන් වැද සිටින වීරෝදාර රණවිරුවන්ට ධෛර්යයක් වන්න. ඔවුන්ගේ දූ දරුවන්ට ආලෝකය ලබා දෙන්න.අප සමඟ එක්වන්න.

## සියලු විමසීම්:


අධිනීතිඥ එස්.එල් ගුණසේකර මහතා.

මානෙල් මල් ව්‍යාපාරය

අංක 18,

රොඩ්නි පෙදෙස,

කොළඹ-08

දුරකතන/ෆැක්ස් අංක 011-2667512

වෙබ් අඩවිය:- www.manelmal.org

E-mail:- manelmal@sltnet'lk